www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජවිපෙය ලංකාවේ ධනපති පන්තියට සහතික වෙයි

## The JVP reassures Sri Lankan business leaders

**නන්ද වික්‍රමසිංහ**
**2004 පෙබරවාරි 25**

අලුතින් ගොඩ නගන ලද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන අතර සන්ධානයේ ප්‍රථම පියවරක් වූයේ අප්‍රේල් 2 මැතිවරනයෙන් තම සන්ධානය බලයට පැමිනිය හොත් කොලඹ ඉහලම ධනේශ්වර ව්‍යාපාරිකයන්ට මහ කොම්පැනිවල අවශ්‍යතා රැක දෙන බව යි.

ඔවුන්ගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) පිහිටුවන ලද්දේ ජනවාරි 20 දා ය. මැතිවරන අධිකාරීන් සමග එය ලියාපදිංචි කරන ලද්දේ පෙබරවාරි 6 දා ජනාධිපති කුමාරතුංග අගමැති වික්‍රමසිංහගේ එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව බලයෙන් පහකිරීමට දිනකට පෙර ය. මහ කොම්පැනි ලොක්කන් සමග එජනිස හමුව කොලඹ බන්ඩාරනායක ස්මාරක ජාත්‍යන්තර සම්මේලන ශාලාවේ දී පවත්වන ලද්දේ පෙබරවාරි 17 දා ය.

මෙම හමුවට එක්සත් වානිජ සංසදය (ජේබීස්) සහ එය යටතේ සංවිධානය වූ තවත් වෙලඳ හා කාර්මික මන්ඩල 9 ක් සම්බන්ධ වූහ. ඊට අමතරව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ලෝක බැංකුවේ, සහ අනෙකුත් බහු පාර්ශ්වික ආධාර ඒජන්සිවල නියෝජිතයෝ ද, ප්‍රාදේශීය සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීහු ද, ගනකාධිකාරීහු ද, මූල්‍ය පුවත් පත් කලාවේදීහු ද මෙයට සම්බන්ධ වූහ. ශ්‍රීලනිපය නියෝජනය කරන ලද්දේ කුමාරතුංගගේ ප්‍රධාන උපදේශකයන්ගෙන් එක් අයෙකු වන ලක්ෂ්මන් කදිරගාමර් විසිනි. ආන්ඩුව බලයෙන් පහකිරීමට ටික වේලාවකට පෙර ප්‍රවෘත්ති ඇමති පදවියට ඔහු පත් කරනු ලැබ තිබුනි.

මහා ජාවාරම්කරුවන් සමග මිත්‍ර සන්ථවය කොට ඔවුන් ඉල්ලා සිටින සපථයන් දීම සඳහා ජවිපෙ තම ප්‍රධාන නායකයන් තුන්දෙනෙක් වන සෝමවංශ අමරසිංහ, විමල් වීරවංශ, බිමල් රත්නායක මෙම හමුවට සම්බන්ධ කර තිබුනි.

මෙම රැස්වීම කොලඹ දී පවත්වන ලද්දේ ශ්‍රී ලංකා ආධාර දායක ප්‍රධාන රටවල - එක්සත් ජනපදය, ජපානය සහ යුරෝපා සංගමය - රැස්වීමක් ලංකාවේ තත්වය සමාලෝචනය කිරීම සඳහා පැවැත්වීමට පැය කිහිපයකට පෙර ය. මෙම තත්වය නිදහස් සන්ධානයේ නියෝජිතයන් ඒ නිසා - ව්‍යාපාරික කන්ඩායම්වල සිත් තුල - එනම් ජවිපෙ බලයට පත් වුවහොත් යුද්ධය කරා ආපසු යාම ද ආර්ථික ප්‍රතිව්‍යුහකරනය ඇනහිටීම යනාදී භීතීන් සමනය කිරීමට - වඩවඩාත් ඇඩිව පොලඹවා තිබුනි.

මෙම රැස්වීමේ දී එජනිස හි ප්‍රධාන කථිකයා වූයේ ලක්ෂ්මන් කදිරගාමර් ය. ඔහු 1994 -2001 පොදු පෙරමුනු ආන්ඩුවේ කොටස්කරුවෙකි. ඒ ආන්ඩුව රාජ්‍ය සහනාධාර හා සේවාවන් කප්පාදු කර දමමින්, රාජ්‍ය සන්තක සංගතයන් පුද්ගලීකරනය කරමින් පෘථුල වෙලඳ පොල ප්‍රතිව්‍යුහකරනයන් ක්‍රියාත්මක කලේ ය. එමගින් දස දහස් ගනන් කම්කරුවන්ගේ රැකියා කපන ලදි. තවත් විශාල සංඛ්‍යාවක සේවා කොන්දේසි හා අයිතිවාසිකම් බරපතල ලෙස බාදනය කර දමන ලදි.

මහා ව්‍යාපාරික නායකයන්ට සහතික වීම සඳහා කදිරගාමර් හතර ගාතෙන් ම ක්‍රියාත්මක විය. "ජාත්‍යන්තර හා ජාතික ආයෝජන ඉතා සාදරයෙන් පිලිගනු ලැබේ: නැත අපි ඒවා පසුපස ගොස් කැන්දගෙන ම එන්නෙමු. රටේ ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වන හෙයින් අපි පෞද්ගලික අංශයට හැකි සෑම ආකාරයකින් ම ධෛර්ය දෙන්නෙමු. පෞද්ගලික, අංශයට ප්‍රානභූත ඇත්තවසයෙන් ම තීරනාත්මක භූමිකාවක්, ආර්ථික සංවර්ධනය සඳහා පමනක් නො ව, රටේ ජාතික ජීවිතයේ අනෙකුත් අංශ සඳහා ද ඉටු කිරීමට තිබේ."

දේශීය සමාගම්වලට නවීන කලමනාකරන ක්‍රම මගින් ආධාර කිරීමට ඔහු පොරොන්දු විය. තාක්ෂනයේ නව වර්ධනයන් යොදා ගනිමින් ද, "ආර්ථිකය භූගෝලීය වර්ධනයට විවෘත කිරීම" මගින් ද එසේ කරනු ඇත. කුඩා ව්‍යාපාරකරුවන් දිනා ගැනීමට උත්සාහ කරමින් කදිරගාමර් කුඩා කර්මාන්තකරුවන් "තලා දමන" ගැටලු විසඳීමට එක්සත් ජනතා නිදහස් සන්ධානය වැඩ කරන බව" ද කී ය.

එල්ටීටීඊ සංවිධානය සමග සාම සාකච්ඡා කෙරේ සන්ධානයේ ආකල්පය ගැන ජේබීස් සන්ධානයේ මහේන්ද්‍ර අමරසූරිය විසින් ප්‍රශ්න කරන ලදුව කදිරගාමර් කියා සිටියේ සන්ධානයේ සියලු පක්ෂ එල්ටීටීඊ සංවිධානය සමග සහ "වෙනත් අදාල කන්ඩායම්" සමග දේශපාලන සාකච්ඡාවකට සූදානම් බව ය. සටන් විරාමය "තවදුරටත් පවත්වා ගන්නා බව ද" "එයට බාධා නො කරන බව ද" ඔහු කී ය.

කදිරගාමර්ගේ වචනවලට ව්‍යාපාරිකයන් සාවධානව ඇහුම්කන් දුන් නමුත්, රැස්වීමේ නියම කේන්ද්‍රය පැවතුනේ ජවිපෙ දෙසට ය. ජවිපෙ විසින් "සාම ක්‍රියාවලිය" පිලිබඳව කරනු ලබන ජන සෝෂක හෙලාදැකීම් ද, සිංහල ගොවියන්, කුඩා වෙලෙන්දන්

හා තරුනයන්ට කරන ආයාචනයන් ද නිසා ආර්ථික ප්‍රතිසංස්කරන වැඩපිලිවෙලට බාධා පැනවෙතැ යි වානිජ ප්‍රභූපෙලැන්තිය බියෙන් පසුවෙති.

එහෙත් එවන් බිය වීමකට හේතුවක් නැතැ යි ව්‍යාපාරික ශ්‍රාවකය සැනසීමට ජවිපෙ නායකයෝ කඹුරා සිටියහ. ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ තම පක්ෂය පිලිබඳ වානිජ කවයන් තුල සංසරනය වන දූසමාන ආරංචි ගැන මැසිවිලි කියමින් සිය කතාව ආරම්භ කලේ ය. "පුද්ගලික අංශය ජවිපෙට බිය විය යුතු නැත" යි ඔහු කී ය. සන්ධානය ප්‍රධාන පෙලේ ආධාර දායක රටවල හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද, ලෝක බැංකුව ද ඇතුලු සංවිධාන ද සමග වැඩ කරන බව අවධාරනය කලේ ය.

එහෙත් මහා ජාවාරම්කරුවන්ට සීමා රහිත පොරොන්දුවක් දීමට ඉදිරිපත් වූයේ පිටුවහලේ සිට මෑත දී ආපසු ලංකාවට ගොඩබැස සිටින ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ ය. "අපි වැරදි කලෙමු. ඒ නිසා එක්සත් ජාතික පාක්ෂිකයන් ද ජනතාව ද, රට ද කරදරයට පත් වූහ" යයි කියා සිටි ඔහු මෙසේ පොරොන්දු විය. "කරුනාකර ටිකක් ඉවසිල්ලෙන් බලන්න. අපි දැනටම ඔබව පුදුමයට පත් කර ඇත්තෙමු. ඉදිරියේ දී අපි ඔබව තව තවත් පුදුමයට පත් කරන්නෙමු."

තමාගේ සිතේ තිබුනේ කුමක් දැයි අමරසිංහ එතැන විස්තර කලේ නැත. එහෙත් ජනවාරි 19 දා ලන්ඩනයේ දී *ඒෂියන් ට්‍රිබියුන්* ප්‍රකාශනය සමග කල සම්මුඛ සාකච්ඡාවක දී තමන් "පිරිසිදු ධනේශ්වර ප්‍රජාතන්ත්‍ර වර්ගයේ ආන්ඩුවක්" පිහිටුවන බවට ඔහු කෙලින් ම කියා සිටියේ ය. (ඔහුගේ මෙම සාකච්ඡාව දිලිසෙන පිටකවරයක් සහිතව මුද්‍රනය කර මෙම රැස්වීමට පැමින සිටි ව්‍යාපාරිකයන් හා ජාත්‍යන්තර මූල්‍ය නියෝජිතයන් ද, මාධ්‍ය ද අතට පත්කරන ලදි.) ඔහු මෙසේ ද කී ය. "චීනය, මලයාසියාව, ඉන්දියාව වැනි ආසියානු රාජ්‍ය නායකයන් අනුව ගිය හොත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට ද ලංකාව සම්මුති මට්ටමින් දියුනු කිරීමට පෙර නුවූවිරූ ඉඩකඩ ලැබෙනු ඇත."

කුමාරතුංගට හා වික්‍රමසිංහට එල්ල කල ප්‍රශ්න මාලාවක් මගින් ජේබීස් සංවිධානය ආර්ථික ප්‍රතිසංස්කරන, පුද්ගලීකරනය හා රාජ්‍ය අංශ, කප්පාදුව ද, කම්කරු නීති ප්‍රතිසංස්කරනය ද, රැකියා කප්පාදු පාලනය කරන්නට යන්නේ ද යන්න ද පිලිබඳව, ඔවුන්ගේ ආකල්පය ගැන විමසා තිබුනි. මෙම රැස්වීමේ දී ප්‍රශ්න කරනු ලැබූවිට ශ්‍රීලනිප හා ජවිපෙ නායකයෝ මේවා ගැන පැහැදිලි උත්තර දීම මගහැර සිටියහ. ඔවුන් කීවේ ආන්ඩුව දිගින් දිගට ම බැංකු කටයුතු, විදුලිය සම්පාදනය හා අධ්‍යාපන අංශවල නිරතව සිටින බව ය. එහෙත් අමරසිංහ "එය සියම, ඉන්දියාව හා චීනය" ගැන කලින් කල සඳහන පෙන්නුම් කරන්නේ ලංකාව ලාභ ශ්‍රම වෙලඳ පොලක් ලෙස ජාත්‍යන්තර ප්‍රාග්ධනයට ලබාදීම සඳහා අවශ්‍ය දේ ඉටුකිරීමට ඔවුන් සූදානම් බව ය.

ජේබීස් හමුවේ දී ජවිපෙ කල ප්‍රකාශ අවධාරනය කර සිටින්නේ එම සංවිධානයේ පන්ති ස්වභාවය යි. මාධ්‍යයන් විසින් බොහෝ විට මෙම සංවිධානය "මාක්ස්වාදී" යයි නම් කරනු ලැබේ. එපමනක් නො ව, එය කම්කරුවන් ආමන්ත්‍රනය කිරීමේ දී "සමාජවාදී" වචන මාලා යොදා ගනී. එහෙත් එය වනාහි 1960 ගනන්වල විරෝධයට එලඹුනු ගම්බද තරුන කොටස් අතර ස්ථරවලින් පැන නැගුනු සුලු ධනේශ්වර නිර්මිතයකි. මහා ව්‍යාපාරිකයන්ට තම තේවාව පුදකර සිටීමේ දී අමරසිංහ පරම ලෙස ම එය පැහැදිලි කර සිටින්නේ තම පක්ෂය ධනේශ්වර පද්ධතිය පවත්වා ගෙන යාමට කැප වී සිටින බව යි.

ධනේශ්වර පන්තිය විසින් මෙම පිදවිල්ල කොතරම් දුරට පිලිගනු ලැබේ ද යන්න තවත් කරුනකි. ජවිපෙය ඉතා අස්ථාවර දේශපාලන නිර්මිතයකි. දැනට ම දහනශීලී තත්වයක පවත්නා රටේ තත්වය තවදුරටත් උග්‍රකර රට යුද්ධයට ඇදලීමට එය තර්ජනය කර සිටී. පාලක පන්තියේ කොටස් ජවිපෙ-ශ්‍රීලනිප සන්ධානයට ආධාර කිරීමට හිතන්නට හෝ පටන්ගෙන තිබීම පෙන්නුම් කරන්නේ වත්මන් දේශපාලන අර්බුදයේ ගොරතර ගැඹුර යි.

© www.wsws.org